**විශිෂ්ට පරමාදර්ශී අභිමානවත් පළාත් සභා රාජ්‍ය සේවයක්**

පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව - බස්නාහිර පළාත

மாகாண சபை அரசாங்க சேவை ஆணைக்குழு – மேல் மாகாணம்

**PROVINCIAL COUNCIL PUBLIC SERVICE COMMISSION – WESTERN PROVINCE**

අංක 628,10 වන මහල,ජන ජය සිටි ගොඩනැගිල්ල,නාවල පාර,රාජගිරිය இல.628, 10 வதுமாடி, ஜனஜயசிட்டிவளாகம், நாவலவீதி, ராஜகிரிய No.628,10th Floor,Jana Jaya City Building,NawalaRoad,Rajagiriya

| | | |
|---|---|---|
| මගේ අංකය / எனது இல. / My Ref. } WPC/PSC/EXM/02 | ඔබේ අංකය / உமது இல. / Your Ref. } | දිනය / திகதி / Date } 2025.11. 11 |

ප්‍රධාන ලේකම් (බ.ප.)
ආණ්ඩුකාර ලේකම් (බ.ප.),
සභා ලේකම් (බ.ප.),
සියළු අමාත්‍යාංශ ලේකම්වරු (බ.ප.).

**බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවයේ තනතුරු සඳහා වන කාර්යක්ෂමතා කඩඉම් විභාග සඳහා මාර්ගගත ක්‍රමය ඔස්සේ අයදුම්පත් කැඳවීම - 2026**

බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව මඟින් ඇමුණුම 01හි සඳහන් තනතුරු සඳහා කාර්යක්ෂමතා කඩඉම් විභාග වෙනුවෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

02. ඒ සඳහා අයදුම්කරනු ලබන සුදුසුකම්ලත් අයදුම්කරුවන් බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නිල වෙබ් අඩවිය වන **www.psc.wp.gov.lk** ඔස්සේ මාර්ගගත ක්‍රමය මඟින් (Online) **2025.12.07** දිනට පෙර අයදුම් කල යුතු අතර, එම අයදුම්පත්වල මුද්‍රිත පිටපත් **2025.12.15** දිනට පෙර නියමිත ධූරාවලිය ඔස්සේ බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත යොමු කල යුතුය. මෙම දින වලින් පසුව ලැබෙන අයදුම්පත් දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

04. මේ සම්බන්ධයෙන් ඔබ කාර්යාලයේ හා ඔබ යටතේ වන කාර්යාලවල නිලධාරින් දැනුවත් කිරීමට කටයුතු කරන ලෙසත්, මෙම විභාගයට පෙනී සිටීමට අයදුම්කරුවන් නොමැත්තේ නම් ඒ බවද දන්වා එවීමට කටයුතු කරන ලෙසත් වැඩිදුරටත් කාරුණිකව දන්වා සිටිමි.

තිලක් සෙනරත්
ලේකම්,
පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව,
බස්නාහිර පළාත.

Tel – 0112879614
Fax – 0112879512
Email – ppscwpexm@sltnet.lk

**<u>බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවයේ තනතුරු සඳහා වන කාර්යක්ෂමතා කඩඉම් විභාග සඳහා මාර්ගගත ක්‍රමය ඔස්සේ අයදුම්පත් කැඳවීම - 2026</u>**

> **සැළකිය යුතුයි - සියලුම අයදුම්කරුවන් මාර්ගගත ක්‍රමය (Online) යටතේ පමණක් අයදුම්කළ යුතුය.**

01. ඇමුණුම 01 හි දක්වා ඇති විභාගයන් 2026 වර්ෂයේදී බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පවත්වනු ලබන අතර, ඊට අදාළ දිනයන් අයදුම්කරුවන් හට නිල කෙටි පණිවුඩයක් මගින් දන්වා එවනු ලැබේ.

02. <u>යෝග්‍යතාව</u>

බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවයේ නිලධාරීහු පමණක් මෙම විභාගයන් සඳහා පෙනී සිටීමට සුදුස්සෝ වෙති.

03. විභාගයන්ට පෙනී සිටීම සඳහා සියලුම අයදුම්කරුවන් මාර්ගගත ක්‍රමය (Online) ඔස්සේ පමණක් අයදුම්කළ යුතුය. එසේ අයදුම් කිරීමෙන් පසුව, යොමු අංකය සහිත මුද්‍රිත පිටපත ආයතන ප්‍රධානියා මගින් නිවැරදි ධූරාවලිය ඔස්සේ අයදුම්පත් යොමු කළ යුතු අවසාන දිනට පෙර එවීමට කටයුතු කළ යුතුය.

(අ) **<u>2025.12.07</u>** දින හෝ ඊට පෙර මාර්ගගත (Online) ක්‍රමය ඔස්සේ අයදුම් කරන ලද මුද්‍රිත අයදුම්පත්‍ර **<u>2025.12.15</u>** දින හෝ ඊට පෙර ලැබෙන සේ **"ලේකම්, පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව (බ.ප), අංක 628, 10 වන මහල, ජන ජය සිටි ගොඩනැගිල්ල රාජගිරිය"** යන ලිපිනයට තම දෙපාර්තමේන්තු ප්‍රධානියා, අමාත්‍යාංශ ලේකම් (බ.ප), මගින් එවිය යුතුය. එසේ කිරීමට අපොහොසත් වන අයදුම්කරුවන් නුසුදුස්සන් ලෙස සලකනු ලැබේ.

**සටහන : අයදුම්පත්‍ර බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්ගේ හෝ මෙම කාර්යාලයේ වෙනත් නිලධාරියෙකුගේ නමට පෞද්ගලිකව නොඑවිය යුතුයි.**

(ආ) මෙම නිවේදනයේ අවශ්‍යතාවන්ට අනුකූල නොවන අයදුම්පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලැබේ. කිසියම් අයදුම්පත්‍රයක් තැපෑලෙන් නැතිවූ බවට හෝ ප්‍රමාද වූ බවට කරන පැමිණිලි ගැන සලකා බලනු නොලැබේ.

04. උපදෙස් වලට අනුකූලව නිවැරදි යොමු අංකයක් සහිතව මාර්ගගත ක්‍රමය ඔස්සේ අයදුම්කරන ලද අපේක්ෂකයන්ට, විභාගය පැවැත්වෙන දිනය සති දෙකකට පමණ පෙර නිල කෙටි පණිවිඩයක් මගින් දන්වනු ලැබේ. ඒ අනුව අයදුම්කරුගේ ප්‍රවේශ පත්‍රය <u>www.psc.wp.gov.lk</u> වන අපගේ වෙබ් අඩවිය මගින් බාගත කරගත හැකිය.

**සටහන: විභාගයට ඇතුලත් කර ගැනීම, විභාගයට පෙනී සිටීමට ඇති යෝග්‍යතාව පිළිගැනීමක් ලෙස සැලකිය යුතු නොවේ.**

05. <u>අපේක්ෂකයන්ගේ අනන්‍යතාව</u>

තමා පෙනී සිටින එක් එක් විෂයයක් පාසා විභාග ශාලාධිපතිට අයදුම්කරු තම අනන්‍යතාව ඒත්තු ගැන්විය යුතුය. මේ සඳහා පහත සඳහන් ලියවිලි වලින් එකක් පිළිගනු ලැබේ.

1. වලංගු හැඳුනුම්පත.
2. වලංගු විදේශ ගමන් බලපත්‍රය.
3. වලංගු රියදුරු බලපත්‍රය.

**සටහන : විභාග ශාලාවේදී සිය අනන්‍යතාව ඉදිරිපත් කිරීමට අපොහොසත් වන අපේක්ෂකයන් නුසුදුස්සන් ලෙස සලකනු ලැබේ.**

06. අසත්‍ය තොරතුරු සැපයීම සම්බන්ධයෙන් දඬුවම්

1. සියළුම අපේක්ෂකයන්ගේ සුදුසුකම් පරීක්ෂා කිරීමකින් තොරව මෙම විභාගයන්ට ඔවුන් සඳහන් කර ඇති සියළු සුදුසුකම් සම්පූර්ණ කළාසේ සලකා විභාග ප්‍රවේශ පත්‍ර නිකුත් කරනු ඇත.

2. මෙම විභාගයේ රෙගුලාසි අනුව කිසියම් අපේක්ෂකයෙකු ඊට පෙනී සිටීමට නුසුදුසු බව පෙනී ගියහොත් විභාගයට පෙරාතුව, විභාගය පැවැත්වෙද්දී හෝ ඉන්පසු කවර අවස්ථාවකදී වුවද, ඔහුගේ/ඇයගේ අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබිය හැකිය. අපේක්ෂකයෙකු විසින් දැන දැනම අසත්‍ය තොරතුරු සපයා ඇති බව හෝ කිසියම් වැදගත් කරුණක් දැන දැනම වසන් කළ බව පෙනී ගියහොත් ඔහු/ඇය බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවයෙන් පහකිරීමට ඉඩ තිබේ. මෙම විභාගයට පෙනී සිටින අපේක්ෂකයන් බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පනවනු ලබන නීති රීති උල්ලංඝණය කිරීම වෙනුවෙන් පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පනවනු ලැබිය හැකි ඕනෑම දඬුවමකට යටත් වෙයි.

07. විභාග ගාස්තු

පළමු වතාවට මෙම විභාග සඳහා අයදුම් කරන අයදුම්කරුවන් හට විභාග ගාස්තු ගෙවීම අවශ්‍ය නොවේ. ඉන්පසුව විභාගයට අයදුම්පත් ඉදිරිපත් කරන අපේක්ෂකයන් විභාග ගාස්තු ලෙස, එක් විෂයයක් සඳහා රු.300/-ක්ද, විෂයයන් දෙකක් සඳහා රු.400/-ක්ද, විෂයයන් තුනක් සඳහා රු.500/-ක්ද, විෂයයන් හතරක් සඳහා රු.600/-ක්ද, ක්ද **බස්නාහිර පළාත් ආදායම් ශීර්ෂ 20-03-02-99** ට බැර වන පරිදි ළඟම පිහිටි **ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට මුදල් ගෙවා ලබා ගන්නා ලද බ.ප 1** ලදුපත හි මුල් පිටපත අයදුම්පත්‍රයට නොගැලවෙන සේ අමුණා එවිය යුතුය.

08. විෂය නිර්දේශය

එක් එක් විභාගයන් සඳහා අදාළ විෂය නිර්දේශය ඇමුණුම 01 හි සඳහන් පරිදි වේ. ප්‍රශ්න පත්‍රයක් සඳහා ලබාදෙන උපරිම ලකුණු ප්‍රමාණය හා සාමාර්ථ ලැබීම සඳහා එක් එක් ප්‍රශ්න පත්‍රය සඳහා ලබාදෙන ලකුණු ප්‍රමාණයන්ද ඇමුණුම 01 හි සඳහන් වේ.

09. අවශ්‍යවුවහොත් මෙම විභාගය සිංහල, දෙමළ, හා ඉංග්‍රීසි යන මාධ්‍යයන් තුනෙන්ම පවත්වනු ලැබේ. අපේක්ෂකයින් විසින් තමා පෙනී සිටින සියළුම ප්‍රශ්න පත්‍ර වලට එකම භාෂා මාධ්‍යයකින් පිළිතුරු සැපයිය යුතුය.

10. මෙම විභාග නිවේදනයට අනුව විධිවිධාන සලසා නොමැති කවර කරුණක් පිළිබඳ වුවද, බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ තීරණය අවසාන තීරණය වන්නේය.

තිලක් සෙනරත්
ලේකම්,
පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව,
බස්නාහිර පළාත.
2025.11. 11

Tel – 0112879614
Fax – 0112879512
Email – ppscwprec@sltnet.lk

ඇමුණුම 01

| අනු අංකය | විභාගය | ප්‍රශ්න පත්‍රයේ නම | විෂය නිර්දේශය | කාලය | ලබාදෙන උපරිම ලකුණු | සාමාර්ථ ලැබීම සඳහා ලැබිය යුතු අවම ලකුණු |
|---|---|---|---|---|---|---|
| 01 | බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ කළමනාකරණ සේවා නිලධාරී සේවයේ I ශ්‍රේණියේ නිලධාරීන් සඳහා වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය වෙනුවට නියමිත පුහුණු පාඨමාලාව | | රාජ්‍ය සේවයේ විනය ක්‍රියාපටිපාටිය | දින 02 | | |
| | | | රාජ්‍ය මූල්‍ය කළමනාකරණය හා වත්කම් කළමනාකරණය | දින 03 | | |
| | | | සංවිධාන ඵලදායීත්වය | දින 02 | | |
| | | | ප්‍රසම්පාදන ක්‍රියාපටිපාටිය | දින 02 | | |
| | | | තොරතුරු දැන ගැනීමේ පනත හා පාරිභෝගික සත්කාරය | දින 01 | | |
| 02 | බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ සංවර්ධන නිලධාරී සේවයට අන්තර්ග්‍රහණය නොවූ ආශ්‍රිත නිලධාරී සේවා ගණයේ තනතුරුවලට අදාළ තෙවන කාර්යක්ෂමතා කඩඉම් විභාගය සඳහා වන දින 10ක පුහුණු පාඨමාලාව | රජයේ සේවයේ කළමනාකරණ/ ජ්‍යෙෂ්ඨ මට්ටමේ නිලධාරියෙකු දැනුවත්ව සිටිය යුතු කළමනාකරණය පිළිබඳ මූලික සිද්ධාන්ත අඩංගු දින 10ක පාඨමාලාවක් සාර්ථකව හදාරා නිමකිරීම | 01. ව්‍යාපෘති කළමනාකරණය | දින 10 | | |
| | | | 02. මහජන සම්බන්ධතාවය සහ සන්නිවේදන කුසලතා | | | |
| | | | 03. නායකත්වය සහ අභිප්‍රේරණය | | | |
| | | | 04. තොරතුරු එක්රැස් කිරීම සහ දත්ත විශ්ලේෂණය | | | |
| | | | 05.සහභාගීත්ව කළමනාකරණය සහ සංවර්ධනය | | | |
| 03 | බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ පළාත් ක්‍රීඩා අමාත්‍යාංශයේ අධීක්ෂණ කළමනාකරණ සහකාර තාක්ෂණික සේවා ගණයේ ක්‍රීඩා පුහුණුකරු III ශ්‍රේණියේ පළමුවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය | 01. පුහුණු න්‍යාය ශාරීරික යෝග්‍යතාව සහ පුහුණු සැලසුම් | පුහුණු න්‍යාය ශාරීරික යෝග්‍යතාව සහ පුහුණු සැලසුම් සකස් කිරීම පිළිබඳ දැනුම | පැය 01 1/2 | 100 | 40% |
| | | 02. පුහුණුකරු තනතුරට අදාළ විනිසුරු බලපත්‍රයක් ලබා තිබීම | අදාළ ජාතික ක්‍රීඩා සංගමය විසින් ලිඛිත හා ප්‍රායෝගික පරීක්ෂණ පවත්වා අදියර 01, අදියර 02, අදියර 03 වශයෙන් නිකුත් කරන බලපත්‍ර සලකා බලනු ලැබේ. | | | |
| 04 | බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ පළාත් ක්‍රීඩා අමාත්‍යාංශයේ අධීක්ෂණ කළමනාකරණ සහකාර තාක්ෂණික සේවා ගණයේ ක්‍රීඩා පුහුණුකරු II ශ්‍රේණියේ දෙවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය | 01. පත්වීම් ලිපියේ හෝ රාජකාරි පැවරීමේ ලිපියේ වගකීම් පවරා ඇති ක්‍රීඩාවට අදාලව පුහුණු සැලසුම් සකස් කිරීම පිළිබඳ දැනුම | වාර්ෂික, මාසික, දෛනික පුහුණු සැලසුම් පිළියෙළ කිරීම පිළිබඳ දැනුම. | පැය 01 | 100 | 40% |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| 05 | බස්නාහිර පළාත් ආදායම් දෙපාර්තමේන්තුවේ තක්සේරුකරු III ශ්‍රේණියට පත් කරනු ලබන නිලධාරීන් සඳහා පැවැත්වෙන I වැනි කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය | බදු නීතිය | පළාත් ආදායම් දෙපාර්තමේන්තුව විසින් පරිපාලනය කරනු ලබන මුද්දර ගාස්තු, පිරිවැටුම් බදු සහ අනෙකුත් බදු හා ගාස්තු වලට අදාළ නීතිය පිළිබඳ දැනුම පරික්ෂා කරීම සඳහා සකස් කරනු ලබන ප්‍රශ්න පත්‍රයකි. | පැය 03 | 100 | 40% |
| | | රජය විසින් පරිපාලනය කරනු ලබන බදු හා ගාස්තු | රජය විසින් පරිපාලනය කරනු ලබන බදු හා ගාස්තු පිළිබඳ දැනුම පරික්ෂා කිරීම සඳහා සකස් කරන ලද ප්‍රශ්න පත්‍රයකි. | පැය 01 | 100 | 40% |
| | | බදු කාර්ය පරිපාටිය හා බදු පරිපාලනය | පළාත් ආදායම් දෙපාර්තමේන්තුව විසින් පරිපාලනය කරනු ලබන බදු සම්බන්ධයෙන් අනුගමනය කරනු ලබන කාර්ය පරිපාටිය පිළිබඳව සහ ශ්‍රී ලංකාවේ බදු පරිපාලනය ආශ්‍රිත සාමාන්‍ය කරුණු පිළිබඳව පරික්ෂා කිරීම සඳහා සකස් කරන ලද බහුවරණ ප්‍රශ්න පත්‍රයකි. | පැය 01 | 100 | 40% |
| | | බදු ආගණනය | බදු නීතිය අනුව ගිණුම් තොරතුරු ගැලපීමෙන් බදු බැදියාව ගණන් බැලීම පිළිබඳව දැනුම පරික්ෂා කිරීමට සකස් කරනු ලබන ප්‍රශ්න පත්‍රයකි. | පැය 02 | 100 | 40% |
| 06 | බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ පළාත් ක්‍රීඩා අමාත්‍යාංශයේ කළමනාකරණ සහකාර තාක්ෂණ බණ්ඩ - 2 සේවා ගණයේ ක්‍රීඩා නිලධාරී I වන ශ්‍රේණියේ තුන්වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය | **මුදල් රෙගුලාසි පිළිබඳ මූලික දැනුම** | මුදල් රෙගුලාසි IV, V, VI, IX පරිච්ඡේද | පැය 01 | 100 | 40% |
| | | **පුහුණු න්‍යායයන් පිළිබඳ සාමාන්‍ය දැනුම** | පුහුණු මූලධර්ම, පුහුණු ක්‍රම පිළිබඳ දැනුම | පැය 01 | 100 | 40% |
| 07 | බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ පළාත් ක්‍රීඩා අමාත්‍යාංශයේ කළමනාකරණ සහකාර තාක්ෂණ බණ්ඩ - 2 සේවා ගණයේ ක්‍රීඩා නිලධාරී II වන ශ්‍රේණියේ දෙවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය | **පරිගණක පරීක්ෂණය** | 01. මයික්‍රෝසොෆ්ට් ඔෆිස්.<br>02. මයික්‍රෝසොෆ්ට් වර්ඩ්.<br>03. මයික්‍රෝසොෆ්ට් එක්සෙල්.<br>04. මයික්‍රෝසොෆ්ට් පවර් පොයින්ට්. (මෘදුකාංග මෙහෙයවීම)<br>05. අන්තර්ජාලය භාවිතය පිළිබඳ මූලික දැනුම. | පැය 01 | 100 | 40% |
| | | **විනිසුරු බලපත්‍ර 02ක් ලබා තිබිය යුතුයි.** | **අදාළ ජාතික ක්‍රීඩා සම්මේලනය/ සංගමය විසින් ලිඛිත හා ප්‍රායෝගික පරීක්ෂණ පවත්වා නිකුත් කර තිබිය යුතුයි.** | | | |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| 08 | බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ පළාත් අභ්‍යන්තර විගණන ඒකකයේ ආශ්‍රිත නිලධාරී සේවා ගණයේ අභ්‍යන්තර විගණන නිලධාරි තනතුර සඳහා වන 1 වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය | ගණකාධිකරණය | ගිණුම් තැබීමේ ප්‍රකාශවල සීමාවන්, ගිණුම් වර්ගීකරණය, වත්කම් ඇගයීම ඇතුළු පොදු සංකල්ප, භාණ්ඩාගාර ගිණුම්, රාජ්‍ය ගිණුම්, රාජ්‍ය ආදායම් ගිණුම්, විසර්ජන ගිණුම්, අත්තිකාරම් ගිණුම්, විදේශ ආධාර ගිණුම් තැබීම (පළාත් සභා ද ඇතුළුව), රාජ්‍ය සංස්ථාවල සහ පළාත් පාලන ආයතනවල ගිණුම්, ගිණුම් හා සංඛ්‍යාත අනුපාතයන්, වැඩසටහන් අයවැය, රජයේ/ පළාත් සභා ඇස්තමේන්තු ස්වරූපය, ව්‍යාපෘති ඇගයුම, ද්‍රව්‍ය, ශ්‍රම හා පොදුකාර්ය පිරිවැයකරණය ආදි ක්ෂේත්‍ර ඇතුළත් ප්‍රශ්න පත්‍රයකි. | පැය 03 | 100 | 40% |
| | | විගණනය | ගණන් දීමේ වගකීම, විගණනයේ අවශ්‍යතාව, විගණන විෂය පථය ඇතුළු පොදු සංකල්ප, විගණකාධිපති කාර්යයන්, මූල්‍ය විගණනය, සකසුරුවම්කම, කාර්යක්ෂමතාවය සහ ඵලදායීතාවය පිළිබඳ විගණනය, ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරි ආයතන මඟින් නිකුත් කරන ලද විගණන ප්‍රමිතීන්, ගනුදෙනු, වත්කම්, බැරකම් පිළිබඳ විගණනය, විකුණුම්, මිලදී ගැනීම්, මුදල් ලැබීම්, ගෙවීම්, ඉන්වෙන්ට්‍රි පාලනය හා සම්බන්ධ පද්ධති, රජයේ දෙපාර්තමේන්තු, රාජ්‍ය සංස්ථා, රජයට පවරා ගත් ව්‍යාපාරික කටයුතු සහ පළාත් පාලන ආයතන පිළිබඳ විගණනයේ ප්‍රමුඛ ලක්ෂණ, අත්තිකාරම් ගිණුම් හා අරමුදල් විගණනය, විගණන වාර්තා ආකෘති, අභ්‍යන්තර විගණනයෙන් ඉටු වන කාර්යභාරය, රාජ්‍ය පළාත් සභා ගිණුම් කාරක සභාවෙන් සහ රාජ්‍ය ව්‍යවසායන් පිළිබඳ කමිටුවෙන් ඉටු වන කාර්යභාරය, භාණ්ඩාගාර සටහන් ආදි ක්ෂේත්‍ර ඇතුළත් ප්‍රශ්න පත්‍රයකි. | පැය 03 | 100 | 40% |
| | | මුදල් රෙගුලාසි හා මූල්‍ය කාර්ය පරිපාටිය | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදි ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ මූල්‍ය විධිවිධාන, පළාත් පාලන මූල්‍ය කාර්ය පරිපාටිය, 1971 අංක 38 දරණ මුදල් පනත (II කොටස), රජයේ මුදල් රෙගුලාසි, පළාත් සභා මූල්‍ය රීති, ගබඩා හා ටෙන්ඩර්, අග්‍රිම හා අත්තිකාරම්. | පැය 03 | 100 | 40% |
| | | පරිපාලනය හා නීතිය | ආයතන සංග්‍රහයේ I හා II කොටස්, කාර්යාල සංවිධාන හා ක්‍රම, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව, පළාත් සභා පනත, පළාත් පාලන ආයතන පිළිබඳ පනත්, ප්‍රාදේශීය සභා පනත, පළාත් සභාවේ විවිධ ප්‍රඥප්ති ආදී පිළිබඳ අවබෝධය. | පැය 03 | 100 | 40% |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| 09 | බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ තාක්ෂණ සේවයේ (සිවිල්) පුහුණු ශ්‍රේණියට බඳවාගත් නිලධාරීන් III ශ්‍රේණියට ඇතුළත් කිරීම සඳහා වන විභාගය | බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ තාක්ෂණ සේවයේ (සිවිල්) පුහුණු ශ්‍රේණියේ නිලධාරීන් සඳහා වන විභාගය | Concrete Technology and Civil Engineering Materials | පැය 03 | 100 | 40% |
| | | | • Identification of counstruction materials. | | | |
| | | | • Testing of materials. | | | |
| | | | • Identification of Timber. | | | |
| | | | • Basic properties of (a) Rubble, Brick, Lime, Cement, Reinforcement, Paints, Tiles, Timber | | | |
| | | | • Taking off Quantities for building, Road's, Tracec, Culvens. BSR/HSR/ISR | | | |
| | | | 5 (Five) optional questions will cover the following subject areas. | | | |
| | | | (a) Building Construction and Maintenance | | | |
| | | | • Knowledge on standard specification of building work. | | | |
| | | | • Method of measurement of building work. | | | |
| | | | • Setting out of work. | | | |
| | | | • Visual identification of workmanship. | | | |
| | | | (b) Water Supply, Drainage, Sewerage, Plumbing Systems, Water Supply | | | |
| | | | • Pipe Diameters and Types. | | | |
| | | | • Pumps. | | | |
| | | | • Water Tanks. | | | |
| | | | • Sumps. | | | |
| | | | **Sewer** | | | |
| | | | • Manhole Type. | | | |
| | | | • Septic Tank. | | | |
| | | | • Soakage pits. | | | |
| | | | • Plumbing layout of Building. | | | |
| | | | • Treatment plant. | | | |
| | | | • Accessories. | | | |
| | | | • Waste Water Disposal System. | | | |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| | | | **(c) Road Construction and Maintenance** | | | |
| | | | • Earth Work volume measurements. | | | |
| | | | • Cut and fills. | | | |
| | | | • Culverts Bridges Rubble Walls Abutments. | | | |
| | | | **(d) Interpretation of Building Regulations** | | | |
| | | | • Selection of Lands. | | | |
| | | | • Restriction in ventilation. | | | |
| | | | • Loacation of toilet pits, septic tank etc. | | | |
| | | | **(e) Minor Irrigation Work** | | | |
| | | | • Quantification of earth work. | | | |
| | | | • Important factors to be considered in an anicut scheme. | | | |
| | | | • Social and Agricultural aspectsin in a irrigation scheme. | | | |